ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2018/08/21 |

## 2018 ජූලි මස උද්ධමනය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි (ජා.පා.මි., 2013=100) විචලනය මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය ලක්ෂ්‍යමය පදනම මත 2018 ජුනි මාසයේ දී පැවැති සියයට 2.5 ට සාපේක්ෂව 2018 ජූලි මාසයේ දී සියයට 3.4 ක් දක්වා ඉහළ ගියේය. මෙම ඉහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන් පෙර වසරේ පැවති පහළ පදනම සහ ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිලෙහි වූ මාසික ඉහළ යෑම හේතු විය. වාර්ෂික සාමාන්‍ය පදනම මත මනිනු ලබන ජා.පා.මි දර්ශකයෙහි වෙනස 2018 ජුනි මාසයේ දී වාර්තා වූ සියයට 5.3 සිට 2018 ජූලි මාසයේ දී සියයට 5.1 දක්වා පහළ ගියේය.

මාසික වෙනස්වීම සැලකූ විට, ජා.පා.මි. දර්ශකය 2018 ජුනි මාසයේ වාර්තා වූ දර්ශක අංක 126.5 සිට 2018 ජූලි මාසයේ දී දර්ශක අංක 126.6 දක්වා සුළු වශයෙන් ඉහළ යෑමට ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිලෙහි ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු වූ අතර විශේෂයෙන් ප්‍රවාහන උප අංශයට අයත් පෙට්‍රල් සහ ඩීසල් මෙන්ම විවිධ භාණ්ඩ හා සේවා උප කාණ්ඩයට අයත් අයිතම කිහිපයක් ද මේ සඳහා දායක විය. මේ අතර, මාසය තුළදී ආහාර කාණ්ඩයේ

අයිතමවල මිල පහළ ගිය අතර, පොල්, සහල් සහ දෙහි වල කැපී පෙනෙන මිල පහළ යෑම් දක්නට ලැබිණි.

ආර්ථිකයෙහි යටිදැරි උද්ධමනය නිරූපණය කරන ජා.පා.මි දර්ශකයෙහි මූලික උද්ධමනය, ලක්ෂ්‍යමය පදනම මත 2018 ජුනි මාසයේ දී පැවති සියයට 1.8 හි සිට 2018 ජූලි මාසයේ දී සියයට 2.3 දක්වා ඉහළ ගියේය. මේ අතර, වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය 2018 ජුනි මාසයේ දී වාර්තා වූ සියයට 2.9 හි සිට 2018 ජූලි මාසයේ දී සියයට 2.7 දක්වා පහළ ගියේය.



## ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි හැසිරීම

**පදනම : 2013 = 100**

| වසර | මාසය | දර්ශක අගය | | මාසික % වෙනස | | ලක්ෂ්‍යමය % වෙනස | | වාර්ෂික සාමාන්‍ය % වෙනස | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. (මූලික) | ජා.පා.මි. ද. | ජා.පා.මි.ද. (මූලික) | ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. (මූලික) | ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. (මූලික) |
| 2016 | ජනවාරි | 112.0 | 113.4 | -1.1 | 0.4 | -0.7 | 3.0 | 2.9 | 4.3 |
| | පෙබරවාරි | 110.8 | 113.9 | -1.1 | 0.4 | 1.7 | 4.6 | 2.6 | 4.4 |
| | මාර්තු | 110.0 | 114.3 | -0.7 | 0.4 | 2.2 | 5.0 | 2.4 | 4.5 |
| | අප්‍රේල් | 111.6 | 115.7 | 1.5 | 1.2 | 4.3 | 5.9 | 2.6 | 4.7 |
| | මැයි | 113.7 | 117.5 | 1.9 | 1.6 | 5.3 | 7.2 | 2.7 | 5.0 |
| | ජූනි | 116.1 | 118.2 | 2.1 | 0.6 | 6.4 | 7.5 | 3.1 | 5.3 |
| | ජූලි | 115.2 | 117.9 | -0.8 | -0.3 | 5.8 | 6.8 | 3.4 | 5.5 |
| | අගෝස්තු | 113.3 | 117.4 | -1.6 | -0.4 | 4.5 | 6.0 | 3.6 | 5.6 |
| | සැප්තැම්බර් | 113.5 | 117.7 | 0.2 | 0.3 | 4.7 | 5.7 | 3.8 | 5.7 |
| | ඔක්තෝබර් | 114.7 | 118.2 | 1.1 | 0.4 | 5.0 | 5.7 | 4.0 | 5.7 |
| | නොවැම්බර් | 116.6 | 120.4 | 1.7 | 1.9 | 4.1 | 6.8 | 4.0 | 5.8 |
| | දෙසැම්බර් | 118.0 | 120.5 | 1.2 | 0.1 | 4.2 | 6.7 | 4.0 | 5.9 |
| 2017 | ජනවාරි | 119.3 | 121.4 | 1.1 | 0.7 | 6.5 | 7.1 | 4.6 | 6.2 |
| | පෙබරවාරි | 119.9 | 122.0 | 0.5 | 0.5 | 8.2 | 7.1 | 5.1 | 6.4 |
| | මාර්තු | 119.5 | 122.3 | -0.3 | 0.2 | 8.6 | 7.0 | 5.6 | 6.6 |
| | අප්‍රේල් | 121.0 | 122.5 | 1.3 | 0.2 | 8.4 | 5.9 | 6.0 | 6.6 |
| | මැයි | 121.8 | 123.0 | 0.7 | 0.4 | 7.1 | 4.7 | 6.1 | 6.4 |
| | ජූනි | 123.4 | 123.1 | 1.3 | 0.1 | 6.3 | 4.1 | 6.1 | 6.1 |
| | ජූලි | 122.4 | 122.9 | -0.8 | -0.2 | 6.3 | 4.2 | 6.2 | 5.9 |
| | අගෝස්තු | 122.3 | 123.0 | -0.1 | 0.1 | 7.9 | 4.8 | 6.5 | 5.8 |
| | සැප්තැම්බර් | 123.3 | 123.1 | 0.8 | 0.1 | 8.6 | 4.6 | 6.8 | 5.7 |
| | ඔක්තෝබර් | 124.8 | 123.1 | 1.2 | 0.0 | 8.8 | 4.1 | 7.1 | 5.6 |
| | නොවැම්බර් | 126.4 | 123.8 | 1.3 | 0.6 | 8.4 | 2.8 | 7.5 | 5.2 |
| | දෙසැම්බර් | 126.6 | 123.8 | 0.2 | 0.0 | 7.3 | 2.7 | 7.7 | 4.9 |
| 2018 | ජනවාරි | 125.8 | 123.9 | -0.6 | 0.1 | 5.4 | 2.1 | 7.6 | 4.5 |
| | පෙබරවාරි | 123.7 | 124.4 | -1.7 | 0.4 | 3.2 | 2.0 | 7.2 | 4.1 |
| | මාර්තු | 122.8 | 124.6 | -0.7 | 0.2 | 2.8 | 1.9 | 6.7 | 3.6 |
| | අප්‍රේල් | 122.9 | 124.8 | 0.1 | 0.2 | 1.6 | 1.9 | 6.1 | 3.3 |
| | මැයි | 124.3 | 125.1 | 1.1 | 0.2 | 2.1 | 1.7 | 5.7 | 3.1 |
| | ජූනි | 126.5 | 125.3 | 1.8 | 0.2 | 2.5 | 1.8 | 5.3 | 2.9 |
| | ජූලි | 126.6 | 125.7 | 0.1 | 0.3 | 3.4 | 2.3 | 5.1 | 2.7 |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව